# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන
தொலைபேசி:**(94) 011- 2694560**
Telephone

ෆැක්ස්
தொலைநகல்:**(94) 011- 2692254**
Fax

ඊ-මේල්
மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk**
E-mail

වෙබ් අඩවිය
இணையத்தளம்: **www.pubad.gov.lk**
Web Site


---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/පොදු/01

ඔබේ අංකය / Your No:

දිනය / திகதி: / Date: 2021.01.20

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධව යොමු කෙරෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම</u>**

ඒකාබද්ධ සේවා අංශයේ සංවර්ධන නිලධාරී ශාඛාව මඟින් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් 50,000 කට අධික සංඛ්‍යාවකගේ ආයතනික කටයුතු සිදු කරනු ලබන අතර පහත සේවා අවශ්‍යතා වෙනුවෙන් දෛනිකව ශාඛාවට ලැබෙන ලිපි සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගන්නා බැවින් එක් එක් නිලධාරියා වෙනුවෙන් ඔහුගේ/ඇයගේ ලිපිගොනුවල පවතින අඩුපාඩු ලිපි මඟින් දැනුම්දීමේදී විශාල කාලයක්, ශ්‍රමයක් මෙන්ම පිරිවැයක් දැරීමට සිදුවේ.

02. එමනිසා සංවර්ධන නිලධාරී ශාඛාව වෙත යොමුවන සංවර්ධන නිලධාරීන්ගේ පහත ආයතනික කටයුතු සිදු කිරීම පිණිස ඔවුන්ගේ ලිපිවල පවතින අඩුපාඩු 2021.02.15 දින සිට සෑම සඳුදා දිනයකදීම මෙම අමාත්‍යාංශීය වෙබ් අඩවියේ පළ කරනු ලබන බව කාරුණිකව දන්වමි. මෙමඟින් දෛනිකව අංශය වෙත ලැබෙන ලිපි සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට හැකි වන අතර ලිපිගොනුවල ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන්ට පෞද්ගලිකව මැදිහත්වීමට අවකාශ ලැබීම මඟින් තම සේවා අවශ්‍යතා කඩිනමින් ඉටු කර ගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 හා එහි අනුශාංගික චක්‍රලේඛ අනුව සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණයට මනාපය පලකල නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම
- භාණ්ඩාගාර චක්‍රලේඛ 394 ප්‍රකාරව නම් වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබා දීම
- සේවයේ ස්ථිර කිරීම සඳහා අනුමැතිය ලබා දීම
- උසස්වීම් සඳහා අනුමැතිය ලබා දීම

- වැඩ බැලීම් සඳහා අනුමැතිය ලබා දීම

- සංවර්ධන නිලධාරි සේවයෙන් ස්ථිරව/තාවකාලිකව මුදාහැරීම සඳහා කරනු ලබන ඉල්ලීම්වලට අනුමැතිය ලබා දීම

- විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම

- ස්ථාන මාරුවීම් සඳහා අනුමැතිය ලබා දීම

- සේවයෙන් විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබා දීම

03. මේ සම්බන්ධව නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වෙබ් අඩවියේ පළ කරනු ලබන අඩුපාඩු ලේඛන ආවරණ ලිපියක් සහිතව මා වෙත යොමු කළ යුතු බවත් කාරුණිකව දන්වන අතර අදාල ලේඛන පරිලෝකනය කර මේ සමඟ එවා ඇති ඇමුණුම 01 හි දැක්වෙන පරිදි අදාල නිලධාරී වෙත ඔබ/ඔබ යටතේ වගකීම දරන මාණ්ඩලික නිලධාරියකුගේ කාර්යාලීය විද්‍යුත් තැපැල මඟින් එම ලේඛන යොමු කිරීමේ හැකියාවද ඇති බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

04. දැනට මෙරට පවතින COVID-19 වසංගත තත්වය හේතුවෙන් අඩුපාඩු ලේඛන භාරදීම සඳහා අමාත්‍යාංශය වෙත නොපැමිණෙන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

## සංවර්ධන නිලධාරීන් සම්බන්ධව තොරතුරු/ලේඛන එවිය යුතු විද්‍යුත් තැපැල් ලිපින

| කාරණය | නම | තනතුර | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| මුදාහැරීම්, විදේශ නිවාඩු. වැඩ බැලීම් | එල්.ඩී.වී. තිලකරත්න මයා | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ IV | dcs-iv@pubad.gov.lk |
| ස්ථාන මාරු | යූ.එම්.එස්.එස්. මධුශංක මයා | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ | adcs3-dos@pubad.gov.lk |
| උසස් කිරීම් | දිනූෂා එන්.කරුණාතිලක මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ | adcs5-dos@pubad.gov.lk |
| ස්ථිර කිරීම් | එස්. ශිෆ්කා මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ | adcs2-dos@pubad.gov.lk |
| අන්තර්ග්‍රහණ හා ප්‍රතිපත්තිමය කරුණු, විශ්‍රාම ගැන්වීම් | පී.කේ. පත්බේරිය මෙය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ | adcs1-dos@pubad.gov.lk |

**★ ඉහත දක්වා නොමැති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් තොරතුරු/ලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ IV වෙත දැන්වීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.**